# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

**අංක 2462/40 - 2025 නොවැම්බර් මස 14 වැනි සිකුරාදා - 2025.11.14**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**නියෝග අංක : 95**

**2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත (සංශෝධිත)**

20 (5) වැනි වගන්තිය යටතේ නියෝගය

2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතේ 20 (5) වැනි වගන්තිය යටතේ ක්‍රියා කරමින් කිසිම දේශීය සාදන්නෙකු, අසුරන්නෙකු, බෙදාහරින්නෙකු හෝ වෙළෙන්දෙකු විසින් පහත සඳහන් කර ඇති ටින් කළ මාළු වර්ග පහත සඳහන් උපරිම සිල්ලර මිලට වඩා වැඩියෙන් වෙළෙඳාම් කිරීම, වෙළෙඳාම් කිරීම සඳහා ඉදිරිපත් කිරීම, වෙළඳාම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

| *ටින් කළ මාළු වර්ගය* | *බර (ග්‍රෑම්)* | *උපරිම සිල්ලර මිල (ටින් එකක්)* |
|---|---|---|
| බූනා *(Katsuwonus pelamis, Auxis rochei, Euthynnus affinis and Auxis thazard)* | ශුද්ධ බර ග්‍රෑම් 155 සහ දියර රහිත බර ග්‍රෑම් 105 හෝ ඊට වැඩි | රු. 165/- |
| | ශුද්ධ බර ග්‍රෑම් 425 සහ දියර රහිත බර ග්‍රෑම් 280 හෝ ඊට වැඩි | රු. 380/- |
| මැකරල් *(Scomber scombrus, Scomber japonicus and scomber australasicus)* | ශුද්ධ බර ග්‍රෑම් 155 සහ දියර රහිත බර ග්‍රෑම් 105 හෝ ඊට වැඩි | රු. 210/- |
| | ශුද්ධ බර ග්‍රෑම් 425 සහ දියර රහිත බර ග්‍රෑම් 280 හෝ ඊට වැඩි | රු. 480/- |
| ජැක් මැකරල් (ලින්නා - *Decapterus russelli*) | ශුද්ධ බර ග්‍රෑම් 155 සහ දියර රහිත බර ග්‍රෑම් 105 හෝ ඊට වැඩි | රු. 240/- |
| | ශුද්ධ බර ග්‍රෑම් 425 සහ දියර රහිත බර ග්‍රෑම් 280 හෝ ඊට වැඩි | රු. 560/- |

මෙම නියෝගය 2025 නොවැම්බර් මස 15 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.


1A - PG 7349 — 53 (2025/11)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් 2024 දෙසැම්බර් 27 වැනි දින අංක 2416/29 දරන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද නියෝග අංක 92 මෙම නියෝගය මගින් පරිච්ඡින්න කරනු ලැබේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

**හේමන්ත සමරකෝන්,**
සභාපති.

2025 නොවැම්බර් මස 14 වැනි දින,
කොළඹ දී ය.

EOG 11 - 0114

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.